ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 118/ News/ 2011

ක්‍රි. ව. 2011 දෙසැම්බර් 12 සඳුදා
04 වෙළුම - 08 කලඹ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



# ළමා ප්‍රදීපය


සිඟිති කතාව — 7 පිටු

තෙරේසා මඩමේ දියණියකගේ හසුනක් — 8 පිටු

ළමා අපේ චිත්‍ර පිටුව — 12 පිටු

දිළෙන මිණි මුතු — 14 පිටු




## භාග්‍යවත් තෙරේසා මව්තුමිය දයාවේ දූතිකාව

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - **2695984 / 4899611**
ෆැක්ස් : 2692586 - ඊ-මේල් **pradeepaya@yahoo.com**
වෙබ් අඩවිය - **www.colombocatholicpress.lk**

# දුප්පතුන්ගේ සාන්තුවරිය තෙරේසා මව්තුමිය

## ආදරණීය දුවේ පුතේ...

මේ දිනවල අයෙත් කථාබහට ලක් වෙන භාග්‍යවන්තවරියක් පිළිබඳවයි. අද අපි කථා කරන්නට යන්නේ. රාවතාවත්ත "ප්‍රේම් ළමා නිවාසය" මුල් කොට ගෙනයි, ආයෙත් මේ කථා බහා ඇතිවෙලා තිබෙන්නේ. තෙරේසා මව්තුමිය පටන් ගත් මහා දයාවේ සේවාව නිසා ඇය පසුපස ආ ගොඩක් දෙනෙක් එම උතුම් සේවාවට ජීවිතය කැප කළා. රාවතාවත්ත "ප්‍රේම්" ළමා නිවාසයත් එතුමියගෙ නිකායේ සොහොයුරියන් තමන්ගේ සේවාව ලබා දෙන ස්ථානයක්. නමුත් අවාසනාවට අද එය බලධාරීන්ගේ අනවශ්‍ය ඇඟිලි ගැසීම් නිසා යම් අපහසුතාවයකට පත්වී තිබෙනවා.

ආදර දුවේ පුතේ, අද අප රටේ සමහර මාධ්‍ය ඉතාමත් අනවශ්‍ය ලෙස මෙම දයාවේ දූතිකාවගේ සේවාවට පහර දෙන්නෙ කිසිඳු දයාවක් නොමැතිවයි. සත්‍ය දැන දැනත් ඔවුන් බොහෝ විට පහර දෙන්නෙ වෙනත් අරමුණු සිත් හි තබා ගෙනයි යන්නත් අපි අවබෝධ කර ගනිමු.

නමුත් ඔබේ යුතුකමක් වෙනවා, තෙරේසා මව්තුමිය පිළිබඳ සත්‍ය කථාව මුළු මහත් සමාජයටම රැගෙන යන්නට. ඒ නිසා අපි එතුමිය ගැනත් මදක් කල්පනා කර බලමු.

1910 අගෝස්තු 26 වෙනිදා ඇල්බේනියානු දෙමාපියන්ට දාව ස්කොප්යේහිදි උපන් තෙරේසා මව්තුමියගේ මුල් නම ඇග්නස් ගොන්ෂා බොයැක්ෂු යන්නයි. වයස අවුරුදු 18 දී දේව කැඳවීමට අවනතව, අයර්ලන්තයේ ඩබ්ලින් නුවර භාග්‍යවත් කන්‍ය මරිය තුමියගේ ආයතනයට එක් වූ ඇය කන්‍යා සොහොයුරියක වීමෙන් පසුව ඉන්දියාවේ කල්කටා අගරදගුරු පදවියට එවනු ලබනවා. එහි ඩාජිලිං ගම්මානයේ පාසලක භූගෝල විද්‍යා ගුරුවරියක් වූ තෙරේසා මවුතුමියට දිළිඳුන්ට සේවා කිරීමේ සිතිවිල්ල හා දේව අනුග්‍රහය මුලින්ම ලැබුනේ 1946 සැප්තැම්බර් මස 10 වැනිදා දුම්රියක ගමන් කරමින් සිටියදීයි.

තෙරේසා මව්තුමිය මුලින්ම ආධාර වුයේ කල්කටාවේ විදීවල කිසිඳු සරණක් නොමැතිව හුදකලාව රෝගීව මිය යන්නන්ටයි. දිනක් එක් විදියක මරණාසන්නව සිටි රෝගි කාන්තාවක එතුමියට හමු වෙනවා. එම කාන්තාවගේ දෙපා මීයන් විසින් ලැටි ගා තිබිණ. ඉහඳ පණුවන් නලියමින් තිබූ එම තුවාල දුටුවන් තුළ ඇති කළේ පිළිකුලක්. බොහෝ දෙනෙක් නෙත් හා නාස් පුඩුද වසාගෙන ඇය පසුකොට ගියා. එහෙත් තෙරේසා මව්තුමිය නැවතී දණ ගසා ඒ කාන්තාවව සිප ගන්නවා. 1952 වසරේ එම දවසේ එතුමියගේ නිකායේ මරණාසන්න වූවන් සඳහා වූ සේවාව ඇරඹෙනවා.

දේව ආශිර්වාදයෙන්ද, දේව අනුග්‍රහයෙන්ද තෙරේසා මව්තුමියගේ දයාවේ ධර්මදූත නිකායත් එහි ධර්මදූත සේවාවත් වැඩි වර්ධනය වන්නට වුණා. ගිලනුන්, මරණාසන්න වූවන්, ආබාධිතයන්, අනාථ දරුවන්, දුප්පතුන්ගෙත් දුප්පතුන් මෙන්ම ඒඩ්ස් රෝගීහු ද තෙරේසා මව්තුමියගේ ස්පර්ශයෙන් දෙවි සමිඳුන්ගේ ප්‍රේමය අත් දුටුවා.

ආදර දුවේ පුතේ, මෙතුමියගේ සේවාව ආගම් අදහන්නේ නැති රටවල් වන මහජන චීනයේ මෙන්ම කියුබාවේ පිදෙල් කස්ත්‍රෝ පවා දයාවේ ධර්මදූත නිකායේ නිවහන් සිය රටේ විවෘත කරන ලෙස තෙරේසා මව්තුමියට ඇරයුම් කර තිබීම එම සේවාවේ මානව ධර්මතාවය හොඳින් පෙන්නුම් කරනවා. ඒ පමණක් නොවෙයි, මුස්ලිම් රටවල ෂේක්වරුන් පවා කතෝලික මෙම දහම් දූතිකාවන්ට ඇරයුම් කොට තිබෙනවා. අද මෙම නිකාය ලොව පුරා රටවල් 135 වැඩි සංඛ්‍යාවක ව්‍යාප්ත වී තිබෙනවා. පැවදි සොහොයුරියන් 5000 වැඩි පිරිසක්ද එයට එක් වී තිබෙනවා.

ලොව පුරා ඇත දයාවේ ධර්මදූත නිකායේ ගිලන් ශාලා, ලාදුරු රෝගී ජනාවාස, අනාථ නිවාස ආදියේ සංඛ්‍යාව 1300 ඉක්මවා ගොස් තිබෙනවා. එයින් වැඩි සංඛ්‍යාවක් පිහිටා තිබෙන්නේ ඉන්දියාවේ.

එතුමිය කතෝලික වුවද එතුමියගේ සේවාව ලැබූවන් අතර බහුතරයක් වෙනත් ආගම් අදහන්නන්. තෙරේසා මව්තුමිය මුලින්ම තම දයා සේවාව ආරම්භ කරන විට සුපුරුදු ලෙස කිතුනු නොවන කොටස් වල චෝදනා එතුමිය වෙත එල්ල වි තිබුණා. අදටත් එල්ල වෙමින් තියෙනවා.

මෑතකදී අප රටෙත් සිදුවුණේ එම චෝදනා එල්ල වීමයි. එතුමිය ගබ්සාවට විරුද්ධයි. ළමයින් නිරපරාදේ මරා දමනවාට විරුද්ධයි. ළමයින්ට ජීවත් වීමේ අයිතිය ගැනයි ඇය කථා කළේ. අද එතුමියට කරන අපහාස නිසා අප රටේ කතෝලික සභාව විශාල පශ්චත්තාපි දිනයක් සූදානම් කරනවා. සත්‍ය එළිදැක්වේවි. අපි දෙවි ස්වාමින් වහන්සේට යාච්ඤා කරමු. මෙම දයාවේ සාන්තුවරියගේ උතුම් සේවාවට නව ශක්තියක් ලබා දෙමු. අන්තවාදි කොටස් වලට එය හොඳ ජීවිත පාඩමක් වේවි. සත්‍ය තුළ ඒ ජීවිතත් ජය ගනිමු.

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා



# ළමා අපේ පත්තරයට දීගාසිරි...

මාගේ අදහස් ගොනුවක් ලෙස නිමැවුණු ලිපි හා කවි නිර්මාණ ආදිය කිහිප විටකදීම "ළමා ප්‍රදීපයෙහි පලවී ඇත. එමගින් ළමා ප්‍රදීපය මාගේ ජීවිතයේ එක් පැතිකඩකට අත්වැල සපයා හමාරය.

ළමා මනසට සෘජුවම සමීප වන, ළමා කිතුනුවන් ප්‍රබෝධමත් කරන ඉතා අගනා ධර්මානුගත පුවත්පතක් ලෙස ළමා ප්‍රදීපය අර්ථ කතනය කිරීමට මම කැමැත්තෙමි. පිරිහෙමින් පවතින දූෂිත සමාජයක් තුළ අතරමංව වෙසෙන පුංචි අපට දැනුමෙ-න්, යහපත් ආකල්ප වර්ධනය තුළින්, දක්ෂතා එළිදැක්වීම තුළින් හා දේව වචනය දැන ගැනීම මගින් ද සමාජ ගැටළු මධ්‍යයේ වුවද යහපත්ව දිවි ගෙවීමට "ළමා ප්‍රදීපය" ළමා අපටම වෙන්වූ පුවත් පත ඉමහත් පිටුවහලකි.

අපේ සිතැගි පරිදි අප මනස තුළ තෙරපෙන වදන්, සිතුම් පැතුම් හා දැනුම සැම දෙනා සමග බෙදා ගැනීමටත් අන් අයගේ යහපත් ආදර්ශ හා ඔවදන් අප සතු කර ගනිමින් අප දිවි මග සරසා ගැනීමටත් "ළමා ප්‍රදීපය" අපට මං පෙත් විවර කර දෙන ලදි.

මා තුළ මටත් හොරා නිධන්ව තිබූ ලිවීමේ අපූර්ව සහජ හැකියාව ළමා ප්‍රදීපය කියවීමට හුරු වීම තුළින් හෙළි විම මගේ ජීවිතයේ අමතක නොවන මතක සටහනකි.

අප සමාජයෙන් ක්‍රමයෙන් දුරස්ව යන කියවීමේ උතුම් ගුණාංගය හා ලිවීමේ පුරුද්ද මත නැවත ජීවය පෙවීමට ළමා ප්‍රදීපය තුළින් එහි දායක ඔබ සැම දරණ වෑයම අතිශයින් අගනේය.

මගේ පාසල් දිවි ගමනේ අති මහත් වූ පෙරළියක් ඇති කිරීමට "ළමා ප්‍රදීපය" සමත් වුණි. ආගමික්පුවතපත්ලෙසින් දහම් පාසල් දූ දරුවන් හා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වන අපට ලබා දීමට කැප වන සියලු දෙන හටම මම මාගේ හෘදයාංගම ගෞරවනීය ස්තුති ප්‍රශංසාව පුද කර සිටිමි.

මාගේ අදහස් ගොනුවක් ලෙස නිමැවුණු ලිපි හා කවි නිර්මාණ ආදිය කිහිප විටකදීම "ළමා ප්‍රදීපයෙහි පලවී ඇත. එමගින් ළමා ප්‍රදීපය මාගේ ජීවිතයේ එක් පැතිකඩකට අත්වැල සපයා හමාරය. මේ වනවිට මම ලිවීම පුරුද්දක් හා කියවීම විනෝදාංශයක් කර ගනිමින් සාර්ථක මාවතක ගමන් ගනිමින් සිටින්නෙමි.

මෙවන් අමිල මෙහෙවරක නිතර වන "ළමා ප්‍රදීපය" පුවත්පත අප අතට පත් කිරීමට විවිධ අයුරින් සහය වන සැම දෙනාට ළමා අපි දීර්ඝායු පතමු.

**අචිනි කෞශල්‍යා නිලුක්ෂි**
**11 ශ්‍රේණිය,**
**කාර්මේල් බාලිකා ම.ම.වි.**
**හලාවත**

# බොරැල්ල සියලු සාන්තුවරයින්ගේ බාලිකා සිසුවියන්ට ලේඛක වැඩමුළුවක්....





බොරැල්ල සියළු සාන්තුවරයින්ගේ බාලිකා මහා විද්‍යාලයේ සිසුවියන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් පසුගියදා විද්‍යාලීය ශාලාවේ දී පැවැත්වුණි. මේ සඳහා 8, 9 ශ්‍රේණිය හා උසස් පෙළ අංශයේ සිසුවියෝ 150 ක් පමණ සහභාගී වූහ. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. මෙයට එක්වූ සිසුවියන් හට පුවත්පත් කලාව, ජනසන්නිවේදනය හා නිර්මාණකරණය පිළිබඳව දේශක මහතා සරල අයුරින් දැනුවත් කළ අතර අවසානයේදී ලේඛක අභ්‍යාසයක් ද පැවැත්වුනි. මෙම අභ්‍යාසයේ දී ජයග්‍රාහී නිර්මාණයන් ළමා ප්‍රදීපය පුවත්පතේ පළ කිරීමට අවස්ථාවක් ලබා දීම හෙට දිනය ලේඛන කලාවට පිවිසීමට සිටින ආධුනිකයින්ට ලැබුණු සුවිශේෂී වූ අවස්ථාවකි. විදුහල්පතිනි ගරු ඇන් ක්‍රිස්ටීන් පැව්දි සොයුරියගේ අනුශාසකත්වයෙන් මෙය සංවිධානය කෙරෙනි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**සේයා හා සටහන - මාධ්‍ය ඒකකය, සියලු සාන්තුවරයින්ගේ බාලිකා මහා විද්‍යාලය - බොරැල්ල.**

දොන් බොස්කෝ මුනිදුන්ගේ ශුද්ධවූ ධාතුව දංකොටුව කටුකෙන්ද දොමිනික් සාවියෝ ආධුනිකාරාමයට වැඩම කර ඉන් නික්ම යාමට මත්තෙන් එම ආධුනිකාරාමෙය් අධ්‍යක්‍ෂ ගරු ඇන්ටනී පීන්තු පියතුමන්, ප්‍රධාන පියතුමන්ලා සහ සිසු දරුවන් ළමා ප්‍රදීපය සඳහා සේයාරුවකට මුහුණු දුන් අයුරු.

**ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු**








පමුණුගම සේදවත්ත යහපත් එඬේරාගේ පෙර පාසල් දරුවන්ගේ වාර්ෂික විවිධ ප්‍රසංගය පමුණුගම මීසම් සහයක ගරු මංජුල නිරෝෂන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුනි.

ළමුන් නත්තල් කැරොල් ගායනය ඉදිරිපත් කළ අයුරු සේයාරුවෙහි දැක්වේ.

**බෙන්ජමින් කිරිහෙට්ටි**



මහනුවර පදවියේ ජන සංනිවේදන කේන්ද්‍රය විසින් මෙහෙයවන ලද නත්තල් බැති ගී ගායනා තරගාවලියේ නුවරඑළිය දිසා තරග තලවකැලේ සා. පැට්‍රික් විදුහල් ශාලාවේ දී ත් මාතලේ, මහනුවර දිසා තරග මහනුවර සා. අන්තෝනි ආසන දෙව් මැදුරේ දීත් පැවැත්වුණි. නුවරඑළිය දිසා තරග වලින් පළමුවන, දෙවන හා තෙවන ස්ථාන නුවරඑළිය මට්ටකැලේ හා නානුඔය මීසම් කණ්ඩායම් දිනා ගත් අතර මාතලේ, මහනුවර දිසා තරගාවලින් ගැටඹේ, ගම්පල හා කටුගස්තොට මීසම් විසින් පිළිවෙළින් ප්‍රථම, දෙවන, හා තෙවන ස්ථාන දිනා ගන්නා ලදි. දිසා තරගවල පළමු ස්ථානය දිනූ නුවරඑළිය හා ගැටඹේ ගායනා කණ්ඩායම් ඡායාරූපයේ වෙති. **රෝහිනි ඇන්තනි**

**මාසික සිතිවිල්ල**



මෙහි පළවන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.

මාසික සිතිවිල්ල, "දෙසැම්බර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

# සමිඳුට පැසසුම්



සමිඳුන් හට මම ගී ගයමි
එතුමන් මා තුළ සවියක් වී
ජීවිතයෙන් මා එතෙර කළේ
ආලෝකය ඔබමයි සමිඳේ

විශ්වාසය මා තුළ පිරිහී
පාප ක්ලේශයෙන් වල්මත් වී
සිත මගේ දැඩි වී සිටි විටදී
ඔබ මා සරණය වූ සමිඳේ

සතුරන් මා වට කරගද්දී
මිතුරන් මා හැර ගිය විටදී
තනිකම මා සිත රජයද්දී
මා ළඟ සිටියේ ඔබ සමිඳේ

**නිර්මාණි චංචලා නිසසානි**
**13 ශ්‍රේණිය,**
**සියළු සාන්තුවරයන්ගේ බා. විද්‍යාලය**
**බොරැල්ල**

**බොරැල්ල සියලු සාන්තුවරයින්ගේ බාලිකා මහ විද්‍යාලයේ පැවැති ළමා ලේඛක වැඩ මුළුවේදී ලබා දුන් ලේඛක අභ්‍යාසයෙන් ජයග්‍රහණය කළ නිර්මාණයන්**



# හිමිදිරි උදය

හිමිදිරි උදයේ ලා හිරු — අස්සේ
කුරුළු රංචු ගී මා හට — ඇසුනේ
හිරු නැඟ එද්දී මල් — පිබිදෙන්නේ
හිමිදිරි අසිරිය අපට — දැනෙනෙන්නේ

සිසිල් සුළං විඳ ගන්නේ - මුළු පරිසරයම — පිබිදෙන්නේ
පාට පාට මල් පිපෙන්නේ - ලොව සැණකෙලියක් — වන්නේ

**එම්.ඩී. ත්‍යාගා දිල්ෂාරා**
**8 ශ්‍රේණිය**
**සියළු සාන්තුවරයන්ගේ බාලිකා විද්‍යාලය - බොරැල්ල.**



**චමෝදා තත්සරණි**
**9 ශ්‍රේණිය,**
**සියළු සාන්තුවරයන්ගේ**
**බාලිකා මහා විද්‍යාලය**
**බොරැල්ල.**

# වනයේ අසිරිය

පෙණ කැටි ඉතිරෙන නිල් දිය — අතරේ
හංස පැටව් රඟ දෙයි දිය — කෙළියේ
මඳ සුළඟක් විත් තුරුලිය — ගොමුවේ
සිසිල මවයි දසතින් වන — අරණේ

සුවඳ විහිදෙනා මල් ගොමු — පිරිලා
රස එල බුදිනා සතුනුත් — පිරිලා
නිල්වන් දිය දහරා ඇඳ — හැලෙනා
වන සිරියාවයි හද තුළ — පිරෙනා

සිත ගත නළවන බව නම් — සැබෑවයි
දුටු විට පුදුමයි ඒත් — ඇත්තමයි
වන සිරියාවේ අගය — බොහෝමයි
රැක ගැන්මත් සතු වෙන්නේ — අපටමයි

# සාමාන්‍ය පෙළ

අවුරුදු එකොළහක දැනුම
පැය කීපයකට අමුණා
පෑන් තුඩින් කලඑළි බසින
නොසිතූ ලෙසක
හිත කීරි ගැහෙන
ප්‍රශ්න පත්තර වලින්
තීරණය කරයි මුළු දිවියම
ජයගනිමි එය එලෙසම
පහනක් යැයි සිතා
මා දිවි එළිය කරන

**හංසිකා තරින්දි**
**10 ශ්‍රේණිය**
**සියළු සාන්තුවරයින්ගේ බාලිකා මහ විදුහල.**
**බොරැල්ල.**

# 2011 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## සාමාන්‍ය පෙළ 2011 විභාගයේ කතෝලික ධර්මය විෂය සාර්ථකව මුහුණ දෙන්නට ඔවදන් කිහිපයක්

සාමාන්‍ය පෙළ කතෝලික ධර්මය විෂය පැය තුනකට සීමාවූ ප්‍රශ්න පත්‍රයක් ඔබ ඉදිරියෙහි දිග හැරෙන්නට තවත් ඇත්තේ දින කිහිපයක්... ඒ දින කිහිපයට පෙර ඔබ ඉදිරියෙහි දිග හැරෙන පුංචි ඔවදන් කිහිපයකි මේ...

කෙටි ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 සඳහා ඔබට ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව 40 කි. ඒ සඳහා 2008 - 2010 වසරවල ප්‍රශ්න පත්‍ර තුන හොඳින් බලන්න. එහි ඇති කෙටි ප්‍රශ්න 40 දෙස බැලීමේ දී ඔබට හඳුනා ගත හැකි ප්‍රධාන අදහස් කිහි-පයකි.

- පසුගිය ප්‍රශ්න සියල්ල ඇසුරින් 2011 වසරේ කෙටි ප්‍රශ්න පත්‍රය නිර්මාණය වෙයි. පසුගිය වසර තුනේ කෙටි ප්‍රශ්න 120 ඇසුරින් ප්‍රශ්න 15 කට වැඩි ප්‍රමාණයක් සකස් වීම නියතය. ඒ නිසා, ඒ රටාවේ ප්‍රශ්න ගැන හොඳින් බලන්න.

  උදා :- පාස්කු අභිරහස යනු කුමක් ද ? යන්න එක් වසරක අසන ලද ප්‍රශ්නයකි.

- එම ප්‍රශ්නයම වෙනත් ආකාරයකින් මෙසේ වෙනත් වසරක සකස් විය.

  එනම්

  ජේසුස් වහන්සේගේ දුක්වීඳීම, මරණය සහ උත්ථානය යනු කුමක්ද ?

- ඒ ප්‍රශ්නයම තවත් වසරක මේ ආකාරයෙන් ගොඩ නැඟිණි. එනම්,

  ජේසුස් වහන්සේගේ ධර්මදූත කාර්යයේ උච්චතම අවස්ථාව වන්නේ කුමක්ද යන්න.

මේ ප්‍රශ්න සියල්ල හරහා අපගේ දැනුම මෙසේ සාරාංශ කරමු.

**පාස්කු අභිරහස** → **ජේසුස් වහන්සේගේ දුක් විඳීම/මරණය/උත්ථානය** → **ජේසුස් වහන්සේගේ ධර්මදූත කාර්යයේ උච්චතම අවස්ථාව**

මේ සියල්ල තුළ ඔබට පසුගිය වසරවල ඉදිරිපත් වූ කෙටි ප්‍රශ්න නැවත හොඳින් බලන්න. ලකුණු 40 න් 30 ට වඩා අඩුවීම ඔබගේ අවසන් ප්‍රතිඵලය නියත වශයෙන් ම බලපානු ඇත.

- දෙවන ප්‍රශ්න පත්‍රයේ පළමු ප්‍රශ්නය අනිවාර්යය ප්‍රශ්නයකි. ප්‍රශ්න 10 කට පිළිතුරු ලිවීමට සිදුවේ. ඒ සඳහා පිරිනැමෙන මුළු ලකුණු සංඛ්‍යාව 20 කි.

ඒ ප්‍රශ්නවල රටාව අවබෝධ කර ගැනීම සඳහා 2008 - 2010 වසර වල අනිවාර්ය ප්‍රශ්නය දෙස හොඳින් බලන්න.

ඒ ප්‍රශ්න වෙනුවෙන් ඔබට ඉදිරිපත් කළ කෙටි ප්‍රශ්න 150 නැවත පුනරීක්ෂණය කරන්න.

දෙවන ප්‍රශ්න පත්‍රයේ අනිවාර්ය ප්‍රශ්නයට අමතරව, වතවත් ප්‍රශ්න හයක් ඔබ ඉදිරියෙහි පෙළ ගැසෙයි.

එවැනි ප්‍රශ්නවලින් ( III ) යටතේ දිග හැරෙන ලකුණු 05 කිහිපයක් පිළිබඳව පසුව විපරමක් කරමු.

ජේසුස් වහන්සේ මෙන් අන් අය වෙනුවෙන් ජීවිතය පවරා දීමට ඔබට කළ හැකි කාර්යයන් පහක් ලියන්න. (2008/02/11)

දේව වරප්‍රසාදයෙන් පිරිපුන් දරුවකු ලෙස සමාජයට කළ හැකි කාර්යයන් පහක් ලියන්න. (2008/03/111)

මෙම ප්‍රශ්නවලට ලැබෙන ලකුණු ප්‍රමාණය ලකුණු 05 කි.

මෙම ලකුණු 05, උපරිම ලෙස ලබා ගැනීමට නම් හුදෙක් කරුණු පමණක් ලියන්න එපා. සෑමවිටම කරුණු හා අදාළ බයිබල් පාඨයක් සොයා ගෙන කරුණු විග්‍රහ කරන්න. එම කරුණ වඩාත් තහවුරු කිරීමට බයිබල් පාඨය තහවුරු කර ගන්න.

උදා : - සාමය ඇති කරන්නෙක් වීම.

ජේසුස් වහන්සේ කන්ද උඩ දේශනයේ දී "සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය. ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝය" යැයි පැවසූ ආකාරයට අපිදු සාමය ඇති කරන්නන් වෙමින් දෙවියන් වහන්සේගේ දරුවෝ වීමට උත්සාහ කළ යුතුය.

මෙවැනි විග්‍රහයක් තුළ ඉදිරිපත් කරන පිළිතුරු සාර්ථක වෙයි.

දයාබර දියණිය, පුතුණුවෙනි,<br>
විභාගය අත ළඟයි<br>
ඔබ මනස නිරවුල් ද ?<br>
නිරවුල් මනසින් විභාගයේ<br>
සාර්ථකත්වය අත් දකින්න.

**ගරු ඩේමියන් පෙරේරා පියතුමා**

# කඳුළු බිඳු



ශිරාන් එම්. ප්‍රනාන්දු



සිඟිති කථා

මුළු පන්තියම නිශ්ශබ්දය, ඊට හේතුව භූගෝල පාඩම් කෙරෙහි හැම ගේ සිත ඇදී යාමය. මම මනෝ ලෝකයට පිවිසුනෙමි. "පියා නැති අපව හදන්නට අම්මා කොපමණ දුක් විඳිනවා ද, ලබන සුමානේ අපට ගෙයින් පිටවී මහ මග සිඟා කෑමට සිදුවෙනවා. ඊයේ ගේ අයිතිකාර මහත්තයා පැමිණ කුළී ඉල්ලා නුදුන් විට අපට ගෙයින් පිට වී යන්න කියා තර්ජනය කළා.

"සනත්, ලෝකයේ දිගම ගංගාව තිබෙන්නේ කොහේද ? ගුරුතුමා ඇසූ ඒ ප්‍රශ්නයෙන් තිගැස්සුනු මම මනෝලෝකයෙන් ඉවත්ව වහා නැගිට ගත්තෙමි. "යුරෝප-යේ සර්" මට කියවිනි. ළමයි මා දෙස බලා සිනාසුණේය. "මේ ළමයා මෙපමණ වේලා නිදාගෙන සිටියා ද ?" කියමින් මා වෙතට එන ගුරුතුමාගේ රෞද්‍ර මුහුණ දුටු විට මට ඇති වුයේ මහත් බියකි. වේගයෙන් මා වෙත පැමිණි ගුරුතුමා "චටස්, චටස්" යන ශබ්දයෙන් කම්මුලට පාරවල් කීපයක් ගැසුවේය. මගේ ඇසින් කඳුළු බිඳු බේරෙන්නට විය. ළමයි බිරාන්තවී මා දෙස බලා සිටිති.ම"උඹ ගිහින් එළියේ දණ ගහපන්න". "මම වහා බංකුවෙන් නැගිට එළියෙන් දණ ගැසුවෙමි. මගේ සිත තුළ තිබූ දුක දෙගුණ තෙගුන විය. ඒ සමගම ඇත එන මුල් ගුරුතුමා දුටු මම බියෙන් නැති ගතිමි. මුල් ගුරුතුමා මා ළගට පැමිණ එසේ දඬුවම් ලැබීමට හේතු ඇසීය. මම සියල්ල අවංකව කීවෙමි. එතුමා අනුකම්පා වෙන් මෙන් මා දෙස බලා සිටියි. එතුමා අප පංතියට ඇතුළුව අපේ ගුරුතුමා සමග කථා කළේය. ඉන් පසු මට කථා කොට "ගෙදර යන්නට පෙර මාගේ කාමරයට එන්නැ"යි කී මුල් ගුරුතුමා නැවත යන්නට ගියේය. මම පන්තියට ගොස් හොඳින් ඇහුම්කන් දුන්නෙමි. තවම මගේ ඇසින් කඳුළු බිඳු ගලා එයි.

පාසල අවසන් වීමේ සීනු හඬ ඇසුනි. මගේ හද බියෙන් වෙව්ලයි. මුල් ගුරුතුමා මට දඬුවම් කරයි ද ? යන සැකයෙන් යුතුව එතුමාගේ කාමරයට පිවිසුනෙමි. එතුමා ලඟට මා කැඳවා පවුලේ විස්තර මගෙන් ඇසුවේය. මම සියල්ල ඇති සැටි විස්තර කළෙමි. ඒ මොහොතේ දී ද මගේ ඇසින් කඳුළු බිඳු ගලා ගියේය. මුල් ගුරුතුමා මට මුදලින් රුපියල් දහයක් දී එය අම්මාට දී ආහාර පිස ගෙන කන්නට කීවේය. මට එතුමා කෙරෙහි විශාල ආදරයක් හා ගෞරවයක් ඇති විය. මම එතුමාට මුළු හදින් ම ස්තුති පුද ප්‍රීතියෙන් ගෙදර ගියෙමි. ගෙදර ගියවිට දවල් ආහාරයට කිසිවක් නැති බැවින් අම්මා යමක් සොයා ගැනීමට ගිහිල්ලාය. ටික වේලාවකට පසුව අම්මා පැමිණියේ දුකින් බර හදින් යුතුය. අම්මා ඉදිරියට දුව ගිය මම සිදු වූ සියල්ල කියා මුල් ගුරුතුමා දුන් රුපියල් දහය ඇය අත තැබුවෙමි. එවිට මගේ ඇසින් කඳුළු බිඳු වැගිරිණි.

## මෝස්තරයක්



**ෆාතිමා රින්සා රිල්වාන්**
**13 ශ්‍රේණිය,**
**සියලු සාන්තුවරයන්ගේ බාලිකා විද්‍යාලය, බොරැල්ල.**



තෙරේසා මවුතුමියගේ දයාවේ ධර්මදූතිකා නිකාය මගින් මොරටුව රාවතාවත්ත ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ප්‍රේම නිවාසය "බේබි ෆාම්" එකක් ලෙසත්, මුදලට දරුවන් අලෙවි කිරීම ඇතුලු අයථා අන්දමේ ජාවාරම් සිදු කරන "ගුබ්බෑයමක්" බවත් දක්වමින් පසුගිය දිනවල පත්තර හා රූපවාහිනිය මගින් මහා සෝෂාවක් කරනු අසා මගේ පපුව පිච්චිලා ගියා. එදා මං අසරණවූ වේලාවේ - මගේ අම්මා මාව මහ පාරේ කොනක තනි කරලා දමා ගිය වෙලාවේ තෙරේසා අම්මලා තමයි මාව ගෙනත් හැදුවෙ වැඩුවේ. මගේ අම්මා තාත්තා කළුද - සුදු ද කියන්නවත් දන්නේ නැති මං ලෝකය දැක්කේ තෙරේසා මඩමෙ දී යි.

මනුස්සයකුගේ, විශේෂයෙන් කාන්තාවකගේ ජීවිතය වරදින්න ගත වෙන්නේ එක මොහොතයි. ඒ බව මං ඉගෙන ගත්තේ පසුකාලෙකදී. මං හරියටම කියන්න දන්නේ නැති වුණත් අම්මා කෙනෙක් දස මාසයක් සිය කුසේ තබාගෙන හැදු දරුවෙක් මාවතේ තනි කරලා යන්නේ බැරිම තැන කියලා දැන් මට තේරෙනවා. දුක, කඳුළ, සතුට, සිනහව මැද්දේ වැඩුණු මාව කුඩා කාලෙදීම දරුකමට හදා ගත්ත මගේ හැදූ අම්මයි - තාත්තයි මට හරි ආදරෙයි. ඒ ගොල්ලෝ විවාහ වෙලා අවුරුදු ගණනක් වෙලත් දරුවකු නැති නිසා දරුකමට කෙනෙකු හදා ගන්න හිතලා තමයි තෙරේසා මඩමට ඇවිත් තිබුණේ. උසාවිය මගින් නීතියට අනුකූලව ඒ කාරණා කටයුතු සිද්ධ කරලා මාව අරන් ගිහින් තියෙනවා. ඒ කටයුතු වලට නීතිඥයන්ට, නඩු ගාස්තු සඳහා මුදල් ගියත් සිස්ටර්ලා එක සත පහක් වත් අරගත්තේ නැති බව ඒ අය පුන පුනා කියනවා. ඒ ගොල්ලන්ගේ ජීවිතයට ආලෝකයක් උදා කරන්න, ඒ පවුලට දරු සිඟිත්තියකගේ උණුසුම සෙනෙහස ගෙන එන්න මං සමත් වුණා කියලා අම්මයි තාත්තයි හැමවිටම කියනවා.

රාවතාවත්තේ ප්‍රේම නිවාසය ගැන මේ පසුගිය දවස් වල කියැවුණු - ලියැවුණු දේවල් වලින් ඒ දෙන්නා ගොඩාක් කම්පාවට පත් වුණා. දරුවකු නැතිව අවුරුදු දහයක් තිස්සෙ පාළුවෙන් - තනිකමෙන් විතරක් නෙමෙයි, සමාජයේ එක් එක්කෙනාගෙ ඇනුම්පද මැද්දෙ ගත කළ කඳුළු ජීවිතේ නතර වුණේ මං හින්දා කියලා ඒ අයගෙ හෘද සාක්ෂිය මොර ගහනවා.





# තෙරේසා මඩමෙන් ජීවිතය ල

අනික් අතට මාවතේ හැරදා ගිය මං වගේ දැරියකට ජීවිතයේ අලුත් බලාපොරොත්තු ගොඩනැගුණේ ඒ අය නිසා නොවේද ? මා පිය සෙනෙහසක් තබා මවක පියකු වත් හරිහැටි නොදන්නා මං වගේ දැරියකගේ ජීවිතය මේ වගේ සුන්දර කරන්නට හේතුවුනේ තෙරේසා මඩමේ ඒ දයා දූතිකාවන් නේද ?

මං දැන් වැඩිවිය පත් තරුණියක්. මාව හදා ගන්න ගත්තට පස්සෙ තාත්තාට ගොඩාක් සරු වුණාලු. මං හිතන්නේ අඳුරේ තිබූ මගේ ජීවිතය ආලෝකයේ මාවතට ගෙන එන්නට ඒ අය ගත්ත තීරණයට දෙවියන් වහන්සේ ආශිර්වාද කරන්න ඇති. අද රටේ තොටේ සිද්ධ වෙන දේවල් පත්තරවලින් - රේඩියෝ එකෙන් - ටී.





# ද දියණියකගෙන් හසුනක් !

වී එකෙන් දකිනකොට, අහනකොට මගේ ජීවිතය ගැන කොහොම ස්තුති ප්‍රශංසා කරන්නද මන්දා. අද ඇතැම් ළමා නිවාස වලින් දරු දැරියන්ට සිද්ධ වෙන අතවර පීඩා ගැන හොයා බලන්නේ කවුද ? මල් වගේ දැරියන් විනාශ කර විපතේ හෙළන අයට එරෙහිව ගන්නා පියවර මොනවාද ?

කවර හෝ හේතුවක් නිසා තරුණියක් විපතට පත්වූ විට සිද්ධ වෙන දේවල් ගැන අමුතුවෙන් කියන්න ඕනේ නෑ නේද ?

අද අපේ රටට අවශ්‍ය වෙලා තිබෙන්නේ කාගෙවත් හවුහරණක් නැති අසරණ පීඩිත දරුවන් කාන්තාවන් උදෙසා හැකි ඉහළම මට්ටමින් මනුෂත්වයේ දයා ප්‍රේමය පාන - කඩා හැලෙන කඳුළු පිසදා හිසට සෙවනක් සලසන්නට වෙහෙසෙන ජීවමාන ධර්මදූතිකාවන් බඳු තෙරේසා මවුතුමියගේ පැවිදි සොයුරියන්ගේ සේවය නතර කරන්න ද ? කොරහේ කිඹුලන් දකින සමහර අන්තවාදීන් හිතාමතා කරන මේ අඩන්තේට්ටම් වලින් පීඩාවට පත් වන්නේ අපේම ජනතාව නොවේ ද ?

ලංකාවේ අවුරුදු තිහකට වැඩි කාලයක් වචනයෙන් කියා නිම කළ නොහැකි අසමසම සේවයක් ඉටු කරන දයාවේ ධර්ම දූතිකාවන් මට නම් පෙන්නේ ජීවමාන සාන්තුවරියන් හැටියටයි. නීති පොතේ අකුරු ලියවිලි වලින් එහාට ගිය වචනයෙන් කියා විස්තර කළ නොහැකි අපූරු මනුෂ්‍යත්වයේ නොකිලිටි මෙහෙයක් සිදු කරන ඒ සේවාව කිළිටි කරන්නට බොරු බේගල් දෙසා බෑමෙන් හැකිවේද ? ළමුන් සල්ලිවලට විකුණන, ළදරු තවාන්, බේබි ෆාම් ආදී මෙකී නොකී "හීතලු" ගොතා කීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද ?

යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශවල දරු දැරියෝ තවමත් අනාථව වෙසෙති. පියා හා මව අහිමිවූ දරු දැරියෝ පන්දහසක්ද - මව හෝ පියා අහිමි දරු දැරියන් දොලොස් දහසක්ද එහි වෙසෙති. මේ අයට සරණය වන්නට ඉදිරිපත් වන්නේ කවුද ? මේ තත්වය රටේ දැවෙන ගැටළු බැව් මා නොකිවුවත් ඕගොල්ලන්ටත් තේරෙනවා ඇති නේද ? එසේ නම් අඳුරේ පසුවන අප සමාජය තුළ අඳුරට සාප කරමින් - වැඩක් කරන - සෙත සලසන අයට ද්වේශ නොකර ඉටි පහනක් දල්වන්නට එක් වන්නේ කවුද ?

**ශිරාන් මෛත්‍රි**



# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

## පාඩම් අංක : 35

### අභ්‍යාස

අපි ඉගෙන ගත් අයිතිවාසිකම හඟවන අදහස් අඩංගු අභ්‍යාස කීපයක් තුළින් ඒ දැනුම තහවුරු කරගනිමු.

නාම පද කීපයකින් සමන්විත වාක්‍ය ඛණ්ඩ, කොටස් දෙකක් පහතින් දැක්වෙනවා. දෙවැනි කොටසින් (දකුණු පස ඇති) දැක්වෙන්නේ ඒවා අයිති අයයි.

**'S** හෝ **S'** හෝ **of** යොදා ඒවා නිවැරදිව සම්බන්ධ කරන්න.

නිදසුන්:

The owner / that car (අර කාරෙකේ අයිතිකරු)

**පිළිතුර විය යුත්තේ**

The owner of that car යන්නයි.

1. The mother / Shirani (ශිරානිගෙ අම්මා)
2. The hat / Sunil (සුනිල්ගෙ තොප්පිය)
3. The top / the page (පිටුවේ ඉහළ)
4. The daughter / Anthony (ඇන්තනිගෙ දුව)
5. The laws / The government (රජයේ නීති)
6. The wedding / Sister/Ranjith (රංජිත්ගේ සොයුරියගේ විවාහ මංගල්‍යය)
7. Party/friends/Sena (සේනගේ මිතුරන්ගේ පාටිය)
8. The children/Siri and Kusum (සිරි සහ කුසුම්ගේ දරුවන්)
9. The wife/Sunimal (සුනිමල්ගේ බිරිඳ)
10. The cause / the problem (ගැටළුවට හේතුව)
11. The 2nd floor/ building (ගොඩනැගිල්ලේ දෙවැනි තට්ටුව)
12. The house / our neighbours (අපේ අසල්වැසියන්ගේ නිවස)
13. The toys / children (ළමයින්ගේ සෙල්ලම් බඩු)
14. The birthday / my mother (මගේ මවගේ උපන් දිනය)
15. The name / street (පාරේ නම)
16. The newspaper / today (අද පත්තරේ)
17. This company / manager (මේ සමාගමේ කළමනාකරු)
18. This church / the parish priest (මේ පල්ලියේ පියතුමා)
19. The results / examination (විභාගයේ ප්‍රතිඵල)
20. The Son / the lady talking to Marie (මාරි එක්ක කතා කරමින් ඉන්න කාන්තාවගේ පුතා)
21. The school / girls (ගැහැණු ළමයින්ගේ පාසල)
22. The name / film (චිත්‍රපටියේ නම)
23. The magazine / children (ළමයින්ගේ සඟරාව)
24. The car / doctor / friend. (දොස්තරගේ යාළුවාගේ කාරෙක)

**මේ පහත සඳහන් වැකිවල යටින් ඉරි ඇඳි කොටස්වලින් ආරම්භ වන ලෙස වාක්‍ය තනන්න.**

**නිදසුන්** The meeting tomorrow is cancelled.

හෙට මීටිම "කැන්සල්" කරලා.

**පිළිතුර** - Tomorrow's meeting is cancelled.

### අභ්‍යාසය

25. The rain last week caused a lot of damage. (පසුගිය සතියේ වර්ෂාව විශාල හානියක් සිදුකරල තියෙනවා)
26. This is the only cinema in the town. (මේක තමා නගරයේ තිබෙන එකම සිනමාහල)
27. Exports from Srilanka to India have fallen recently (ලංකාවෙන් ඉන්දියාවට අපනයන මෑතකදී පහළ බැස තියෙනවා)
28. Many tourists are attracted by the beauty of our country. (ලංකාවේ ලස්සන බොහෝ සංචාරකයින්ගේ සිත ඇදගන්නවා)

**මේවා ඉංග්‍රීසියෙන් ලියන්න.**

29) මෙතන ඉඳල ගාල්ලට තියෙන්නෙ පැය දෙකක ගමනක්.
30) අපේ ගෙදර ඉඳල දුම්රිය පළට තියෙන්නේ විනාඩි පහක ඇවිදින දුරක්.
31) මම අවුරුදු දෙකක ඉංග්‍රීසි පාඨමාලාවක් හදාරනවා.
32) මම ඊයෙ නිදාගත්තෙ පැයක් විතරයි. (මට ඊයෙ ලැබුනෙ පැයක නින්දක් විතරයි)

**පහතින් ඇති වැකි වල යටින් ඉරි ඇඳි කොටස වෙනුවට වෙනත් විදියකින් එම අදහසම ලැබෙන විදිහට ලියන්න.**

**නිදසුන්**

He is one of my friends.

පිළිතුර - He is a friend of mine.

33. I went to church with three of my friends.
(මම පල්ලි ගියේ මගේ යාළුවො තුන්දෙනෙක් එක්ක)
34. Suren borrowed two of my books.
(සුරේන් මගෙ පොත් දෙකක් ඉල්ලගත්තා.)
35. I was talking to one of our neighbours.
(මම කතා කරමින් හිටියෙ අපේ අසල්වැසියකුත් එක්ක)
36. We met one of your relations.
(අපිට ඔයාගෙ නෑදැයෙක් මුණගැහුණා)
37. Kumari invited some of her friends.
(කුමාරි ඇගේ යාළුවන් කීපදෙනකුට ආරාධනා කළා)
38. The person who drove the car was one of his friends.
(කාරෙක එලවපු කෙනා ඔහුගෙ යාළුවෙක්)

**පරිවර්ථනය කරන්න.**

39. අර මගෙ අම්මගෙ යෙහෙළියක්.
40. මම ඊයෙ රෑ හිටියෙ අපේ නැන්දලෑ දිහා.
41. මේක සමාගමේ කළමනාකරුගෙ අදහසක්.
42. නිමල්ගෙ කමිසෙ මට හරි නැහැ.
43. මේක අපේ සීයාගෙ ගේ
44. මේ පොතේ කවරෙ ඉරිලා.

## පිළිතුරු - **Answers**

01. Shirani's mother
02. Sunil's hat
03. Top of the page
04. Anthony's daughter
05. The laws of the government
06. Ranjith's sister's wedding
07. Sena's friends' party
08. Siri and kusum's children
09. Surimal's wife
10. The cause of the problem
11. The Second floor of the building
12. Our neighbour's house
13. The children's toys
14. My mother's birthday
15. The name of the street.
16. Today's newspaper.
17. The manager of this company.
18. The parish priest of this church.
19. The results of the examination.
20. The son of the lady talking to Marie.
21. The girls' school.
22. The name of the film.
23. The children's magazine.
24. The doctor's friend's car.
25. Last week's rain caused a lot of damage.
26. The town's only cinema is this.
27. Sri Lanka's exports to India have fallen recently.
28. Our country's beauty attracts many tourists.
29. It's a two hours' journey from here to Galle.
නැත්නම්
It's a two-hour journey from here to Galle.

30. It's only a five minutes' walk from our house to the station. නැත්නම්
It's only a five-minute walk from our house to the station.
31. I am following a two years' course in English. නැත්නම්
I am following a two-year course in English.
32. I had only an hour's sleep last night.
33. I went to church with three friends of mine.
34. Suren borrowed two books of mine.
35. I was talking to a neighbour of ours.
36. we met a relation of yours.
37. kumari invited some friends of hers.
38. The person who drove the car was a friend of his.
39. That is a friend of my mother's
40. I was at my aunt's last night.
41. This is an idea of my manager's.
42. Nimal's shirts don't fit me.
43. This is my grand father's house.
44. The cover of this book is torn.

අපි එදිනෙදා ජීවිතයේදී යම් යම් දේ සංඛ්‍යාත්මක වශයෙන් හෝ ප්‍රමාණයෙන් හඳුන්වන අවස්ථා තියෙනවා. **නිදසුන් වශයෙන්** කීප දෙනෙක්, ටික දෙනෙක්, ගොඩක්, සේරමදෙනා, දෙන්නම, ටිකක්, ගොඩක්, ටික දවසක්, සුළු ප්‍රමාණයක් යනාදි වශයෙන් කිසියම් "ප්‍රමාණයක්" ගැන අපි කතා වෙනවා.

අපි ඉංග්‍රීසියෙන් එවැනි යෙදීම් පිළිබඳව පහත පාඩමෙන් දැනුවත් වෙමු.

## Some (සම්) සහ Any (එනි)

**Some කියන්නෙ - සමහරක්, ටික දෙනෙක්, ටිකක් යන අදහස**
**Any කියන්නෙ - කව්රුහරි, මොකක්හරි යන අදහසයි. නමුත් මේ වචන තවත් විවිධ අදහස් කීපයක් ප්‍රකාශ කිරීම සඳහා යොදා ගැනෙනවා. ඒ විවිධ අවස්ථාවන් කීපයක් භාවිත වන සැටි අපි දැනුවත් වෙමු.**

She brought ***some flowers*** to church.
(ෂී බෝට් සම් ෆ්ලවර්ස් ටු චර්ච්)
ඇය මල් ටිකක් (මල් වගයක්) පල්ලියට ගෙනාවා.

I can't come today. I have ***some work.***
(අයි කාන්ට් කම් ටුඩේ. අයි හැව් සම් වර්ක්)
අද මට එන්න බෑ, මට වැඩ වගයක් තියෙනවා.
There are ***some fruits*** in the basket.
(දෙයාර් ආ(ර්) සම් ෆෲට්ස් ඉන් ද බාස්කට්)
බාස්කට් එකේ පළතුරු වගයක් තියෙනවා.

## ජේසු සමිඳාණෝ



**ජේ.ඒ. ඩිමාලි තරුෂිකා**
8 ශ්‍රේණිය,
ශු. සෙබස්තියන් මුනිඳුගේ දහම් පාසල,
තාරවිල්ලුව (අගුණවිල මීසම).




පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

## සා. දොන් බොස්කෝ මුනිතුමා



**රොෂේල් ඇන්ජලෝ පෙරේරා**
7 ශ්‍රේණිය,
ශු. ලාසරස් මුනිඳුන්ගේ දහම් පාසල,
හේකිත්ත.

## ශ්‍රී ශරීරය හා රුධිරය



**සී.පී. රෂාන් සුවිශ්ක**
1 ශ්‍රේණිය,
සා. ජූඩ් පාසල,
කුරණ මීගමුව.

## ශු. අන්තෝනි මුනිතුමා



**ටී. සිතිජ සම්පත් කුමාර**
3 ශ්‍රේණිය,
ශා. සෙබස්තියන් දහම් පාසල,
දඹදුරේ (දෙහියගාත මීසම).

## ශු. එව්ජින්ද මැසනඩ් මුනිතුමා



**සසිඳු ලක්ෂිත**
5 ශ්‍රේණිය,
බැසිලිකා ප්‍රාථමික විද්‍යාලය
රාගම.

## අපේ ගෙවත්ත



**එච්.ඒ. හෂිනි නාරිකා**
2 ශ්‍රේණිය,
සුව සහනය දෙව් මැදුර,
කපුවාගාර (බටගම මීසම).

## සැඳෑ අසිරිය



**සිතුමි නවෝද්‍යා**
3 ශ්‍රේණිය,
සා. නිකුළා දහම් පාසල,
බෝපිටිය.

## නෝවාගේ නැව



**ඔෂාන් රනුෂ්ක ප්‍රැන්සිස්**
2 ශ්‍රේණිය, සා. පේදුරු හා පාවුලු දහම් පාසල, රත්නපුර.

## දිය ඇල්ලක්



**අශේන් දිවන්න**
4 ශ්‍රේණිය, ස්නාපනය ලැබූ ජේසුස් වහන්සේගේ දහම් පාසල, මුට්ටුව.
(නයිනමඩම මීසම)

## අගරදගුරු පදවිය






හල්පේ මීසමේ ශා. ප්‍රැන්සිස් සේවියර් දහම් පාසලට අයත් වූ දරුවන් 52 ක් 125 වන ජයන්ති මංගල මහෝත්සවයට සමාගාමීව ප්‍රථම වරට දිව බොජුන් ලබා ගත්හ. මෙම දිව්‍ය යාගය හල්පේ මීසම් සේවක ගරු අමිල ගෝමස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. දිව්‍ය යාගයෙන් අනතුරුව දිව බොදුන් ලැබූ දරුවන් මීසම් සේවක පියතුමා මිනු/ආඩිමුල්ල ප්‍රාථමික විදුහලේ විදුහල්පතිනී ගරු ජෙමරීටා රාජපක්ෂ හා ගරු මොඩස්ටීන් නෝනිස් යන පැවදි සොයුරියන්, මීසම් සහයක ගරු ප්‍රසාද් ඉන්දික, තේවාචාරි ගරු ඇන්ටන් සුදාරක සොයුරුතුමා හා දහම් ගුරු මහත්මීන් සමග මෙසේ ළමා ප්‍රදීපය සඳහා ඡායාරූපයකට මුහුණ දුන්හ. **සේයා - සිසිල් ඩැනීසියස්**



වග මීසමට අයත් මාවල්ගම ශුද්ධවූ සෙබස්තියන් මුනිඳුන්ගේ දහම් පාසල් දරු දැරියෝ 25 දෙනෙකු පසුගිය දා එම දෙව් මැදුරේ දී ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. දේව මෙහෙය මීසම් සේවක ගරු ප්‍රසන්න සංජීව පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. ගරු පියතුමන්, ගරු එමලිනා පැවිදි සොයුරිය, දහම් ගුරුවරුන් දරු දැරියන් සමග සමූහ ඡායාරූපයට එක් වූ අයුරු. **ජුඩ් රෝෂන් කස්තුරිආරච්චි - වග**

## හලාවත පදවිය



තඹරවිල රෝමානු කතෝලික මිශ්‍ර පාසලේ දරු දැරියන් විසි දෙනෙකුට ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම පසුගිය දා තඹරවිල නිර්දෝෂ දේව මාතාවන්ගේ දෙව් මැදුරේදී මීසම් සේවක ගරු මේරියස් ප්‍රනාන්දු, මීසම් සහයක ගරු නිමන්ත යන පියතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. ගරු පියතුමන්ලා ළමුන් පුහුණු කළ ගුරු මහත්මීන්, තඹරවිල ප්‍රධාන දහම් ගුරු ප්‍රැන්සිස් චාල්ස් ප්‍රනාන්දු මහතා සමග දිවබොදුන් ලැබූ ළමුන් සමූහ සේයාරුවකට මුහුණ දුන් අයුරු. **ඩබ්ලිව්. හෙක්ටර් ප්‍රනාන්දු**

# සිත්තම් කලාවට පෙළහර පානා පුංචි සිත්තරෙක්




පුංචි සන්ධියේ දී ම සිත්තම් කලාවට දස්කම් පාමින් පෙරට එන පුංචි සිත්තරෙකු පිළිබඳව මෙවර ළමා ප්‍රදීපයෙන් ඔබට හඳුන්වා දෙමි. ඔහු නමින් **සිත්මල් උදාන සිල්වා** ය. මොහු බෝපිටිය ලොයලා විදුහලේ ඉගෙනුම ලබයි.

ක්‍රිස්තියානි ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යාංශය 2009 නත්තල් තැපැල් මුද්දරය සඳහා පැවති චිත්‍ර තරගයේ වයස අවුරුදු 10 ට අඩු තරග කාණ්ඩයෙන් මොහු පෙර පාසල් වියේ දී ම තෙවන ස්ථානය ලබා ගත්තේය.



**සිත්මල් උදාන සිල්වා**

2009 වසරේ පැවැති සොළොස් වැනි බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමාගේ 5 වැනි පදවි ප්‍රාප්තිය වෙනුවෙන් ශ්‍රී ලංකා අපෝස්තලික තානාපති කාර්යාලය සංවිධානය කළ චිත්‍ර තරගයෙන් විශේෂ වයස් කාණ්ඩයේ තරගයෙන් දෙවන ස්ථානය හිමි කර ගත්තේය. මීට අමතරව සිත්මල්, රිදී සිත්තම් 2009 සමස්ත ලංකා (චිත්‍ර) තරගයෙන් සම්මාන සහතිකයක් දිනා ගත් ඔහු "වෙරළේ අසිරිය" සමස්ත ලංකා චිත්‍ර තරගය - 2010 තරගයෙන් ද සම්මාන සහතිකයක් දිනා ගන්නා ලදී.

සිත්මල්ට මේ සඳහා දිරිදෙන තම ආදර දෙමව්පියන් සාන්ත මරියා පෙර පාසලේ කොටිල්ඩා පෙරේරා, සුමුදු පෙරේරා යන ගුරු මහත්මියන් සිහි කරනුයේ ආදරයෙනි. ඔවුන්ගේ දිරි දීම ද මෙම ජයග්‍රහනයන්ට මුල් විය.

ලොයොලා විද්‍යාලයේ විදුහල්පති ගුරු නිශාන්ත කුරේ, ඇලතුර මීසම් පාලක ගුරු නොයෙල් සම්පත් යන පියතුමන්ලාගේ දිරි ගැන්වීම ද ඔහුට මහත් ආශිර්වාදයකි. එසේම, ඔහුගේ පන්තිබාර ගුරුතුමිය වන තිලිනි පෙරේරා ගුරුතුමිය ද ආදරයෙන් සිහිපත් කරනු ලබයි.

සිත්තම් කලාවෙන් දස්කම් පානා සිත්මල් උදාන සිල්වා ශිෂ්‍යාට ළමා ප්‍රදීපය සුබ පැතුම්. **(කුමර)**

## අගරදගුරු පදවි ධර්මදූත නත්තල් කැරොල් ගායනා තරග ප්‍රතිඵල

කොළඹ අගරදගුරු පදවි ධර්මදූත ළමා සමාජය විසින් වාර්ෂිකව පවත්වනු ලබන කැරොල් ගායනා තරගය දිසාවන් 13 ක සහභාගීත්වයෙන් පසුගියදා රාජගිරිය දිව්‍ය හෘද දෙව්මැදුරට අයත් ශාලාවේදී පැවැත්විනි. මෙවර තරග ප්‍රතිඵල පහත දැක්වේ.

**කැරොල් ගායනා තරගය** ( සිංහල අංශය)

ප්‍රථම ස්ථානය - වත්තල දිසාව - මත්තුමගල මීසම
දෙවන ස්ථානය - කළුතර දිසාව - පයාගල මීසම
තෙවන ස්ථානය - මීගමුව දිසාව - පල්ලන්සේන මීසම

**කැරොල් ගයනා තරගය** (දමිළ අංශය)

ප්‍රථම ස්ථානය - මැද කොළඹ දිසාව - බොරැල්ල මීසම
දෙවන ස්ථානය - දකුණු කොළඹ දිසාව - තිඹිරිගස්යාය මීසම
තෙවන ස්ථානය - උතුරු කොළඹ දිසාව - ග්‍රෑන්ඩ්පාස් මීසම

**ධර්මදූත පදවි කාර්යාලය - අගරදගුරු මැදුර**

## ස්තුතියි ගුරුතුමියෙනි



අපිට අකුරු,
කියා දෙන අපේ,
ගුරුතුමිය
ගුරු උදයානි
කන්‍යා සොයුරියට
ස්තූතියි !



**ෆ්‍රී ජෙනිසිස් වාස්**
**1 ශ්‍රේණිය,**
**සුරදූතිකා බාලිකා අපේක්ෂාවේ පාසල - පයාගල**

**ළමා ප්‍රදීපය නත්තල් කලාපය ලබන සතියේ**

## අපි වෙමු කිතුනු ළමුන් හඳුනාගනිමු



**නම** - ශවින් අක්ෂිත පෙරේරා

**ශ්‍රේණිය** - 8 ශ්‍රේණිය

**දහම් පාසල** - සා. පීතර විදුහල, බම්බලපිටිය

**කුසලතා** - කවි, චිත්‍ර, පැසිපන්දු



**නම** - පූර්ණා අචින්ත්‍යා ප්‍රනාන්දු

**ශ්‍රේණිය** - 4 ශ්‍රේණිය

**දහම් පාසල** - සා. තෙරේසා දහම් පාසල පේරාදෙණිය

**කුසලතා** - නැටුම්, ගී ගැයීම, චිත්‍ර

## මගේ ආදරණීය ලොකු තාත්තා !



මට ආදර මම ආදර ලොකු තාත්තා
ඔබ සිටිනා කාලය තුළ ලෝකය වැඩ ගත්තා.
මම නොහිතු මොහොතක දෙවිදුන් අර ගත්තා
ඔබ සුරලොව අද ඇති බව මම දැන ගත්තා.

**ප්‍රවීන් හෙට්ටිආරච්චි**
**3 ශ්‍රේණිය, සා. ජෝසප් විදුහල - මීගමුව**

## ප්‍රහේළිකා අංක 27



### හරහට

1. සැම දේටම වඩා වැදගත් වන්නේ ප්‍රේමය බව ශු. පාවුළුතුමා මොවුන්ට යවන ලද පළමු ලිපියෙහි සඳහන් වේ.
4. ශු. ලියවිල්ලේ සළමොන්ගේ ප්‍රඥාව පොතේ පවසන්නේ, ප්‍රඥාව මෙයට වඩා අගනා බවයි.
5. ක්‍රිස්තුන් වහන්සේ මෙය මතදී අප වෙනුවෙන් දිවිපිදු සේක.
7. ........... ක් නැති ඉඩම කොල්ලකනු ලබන්නේයැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.
8. ස්නාවක ජුවාම් තුමාගේ පියා

### පහළට

1. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයට පසුව ප්‍රදර්ශන දොරටුව අසල සිටි මෙවැන්නෙකු පේදුරු තුමා සුව කළේය.
2. ක්‍රිස්තුන් වහන්සේ උකුත් වන විට දේව මාළිගාවේ මෙය දෙකඩව ඉරීගිය බව ශු. ලියවිල්ලේ සඳහන් වෙයි.
3. රන්කාසි දසය පිළිබඳ උපමාවේ, ස්වාමියා රාජ පදවියක් ලබන පිණිස මෙහි ගිය බව පැවසේ.
6. තම අසල්වැසියා හඳුන්වාදීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ මෙම ජාතිකයාගේ උපමාව වදාළ සේක.
8. එළියා දිවැසිවරයා එම රටේ වු තුන් අවුරුදු නියගය නිම කරමින්, දෙවියන් වහන්සේ සැබෑවු එකම දෙවියන් වහන්සේ බව මිනිසුන්ට පෙන්වමින් මෙය ලබා දුන්නේය.

**(මෙම ප්‍රහේළිකාව පිරවීමේදි පහත සඳහන් පරිච්ජේදය ආධාර කරගත හැකිය. ශු. ලුක් 10,19, 23 පරිච්ජේද, ක්‍රියා 3, ශු. මතෙව් 5, 1 රාජාවලිය 17, සලමොන්ගේ ප්‍රඥාව 7, උපදේශකයා හෙවත් සිරාක් 36, 1 කොරින්ති 13)**

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්,**
**ප්‍රහේළිකා අංක 26, ළමා ප්‍රදීපය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

**( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )**

# ගැලවුම්කාර ජේසු

52 කොටස

ශු. ජුවාම්තුමාගේ සුවිශේෂයෙන්

සැකසුම : තිළිණ අලහකෝන්





කොළඹ 08, ඥානාර්ථ ප්‍රදීපය මාවත, අංක 2 හී, ගරු සී.ඩී. සී. රොහාන් ද අල්විස් පියතුමන් විසින් එහිම කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලදී.
සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා